# බෞද්ධ මනෝවිද්‍යාත්මක හා මනෝවිශ්ලේෂණවාදී ගුරුකුලයේ සඳහන් "මනස" පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්


**පූජ්‍ය වැලිපිටියේ පඤ්ඤාරතන හිමි**
ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
wrathanathero@gmail.com

**පූජ්‍ය කරපික්කඩ සෝභිත හිමි**
ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
karapikkadasobitha@gmail.com



බුදු දහමට අනුව අංග තුනක් යටතේ මනස සාකච්ඡා කෙරේ. එනම් චිත්ත, මන, විඤ්ඤාණ යනුවෙනි. එය එකම සංකල්පය තුළ විවිධ වූ ක්ෂේත්‍ර පිළිබඳ බෙදා දැක්වීමක් ලෙස ද සඳහන් කළ හැක. චිත්ත යන්නෙන් චින්තනමය ක්‍රියාවලියත්, මන යන්නෙන් ඉන්ද්‍රීමය සාධකයත්, විඤ්ඤාණ යන්නෙන් හඳුනා ගැනීම හෙවත් විජානනය පිළිබඳවත් අර්ථවත් වන ආකාරය හඳුනාගත හැක. ඊට සාපේක්ෂව ෆ්‍රොයිඩ්ගේ විග්‍රහය තුළ ද මනස ස්තර තුනක් යටතේ සාකච්ඡා කෙරේ. එනම් විඤ්ඤාණය, උප විඤ්ඤාණය හා විඤ්ඤාණය යනුවෙනි. සිතේ වර්තමාන ස්වභාවය පිළිබඳ විඥානය තුළින්ද, මතකයට නගා ගත හැකි අතීත මතකයන් පිළිබඳ උප විඤ්ඤාණය තුළින්ද මතකයට නගා ගත නොහැකි අතීතය පිළිබඳව අවිඥානය තුළින් ද සාකච්ඡා කර ඇත. මෙම සාධක මත පදනම් ව පහත සඳහන් ආකාරයේ කරුණු වෙත අවධානය යොමු කළ හැකිය. බුදුදහමට සාපේක්ෂව ෆ්‍රොයිඩ් සාකච්ඡා කොට ඇත්තේ විඥානමය සාධකයත් මනසේ යාන්ත්‍රික ක්‍රියාවලියකුත් පමණි. බෞද්ධ විග්‍රහය තුළ විඥානය මනසේ එක් පැතිකඩක් පමණි. බෞද්ධ විඥානමය සංකල්පය යනු ෂඩ්ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා අරමුණු හඳුනා ගැනමත්, ඒවා පපඤ්චකරණ ක්‍රියාවලිය දක්වා තවදුරටත් විශ්ලේෂණය කිරීමත්, තුළින් පුද්ගලයා තුළ නිමේෂයක් පාසා සිදුවන සජීවී ක්‍රියාවලියකි. ෆ්‍රොයිඩ්ට අනුව විඥානය යනු මතකයන් තැන්පත් වන කෝෂ්ඨාගාරයක් පමණි. එය අනෙකුත් ඉන්ද්‍රියයන් හා ඍජු සම්බන්ධතාවක් දක්වන ආකාරයක් ගම්‍ය නොවේ. ෆ්‍රොයිඩ්ගේ විග්‍රහයට අනුව විඥානය කොටස් තුනකින් යුක්ත වූවකි. නමුත් බෞද්ධ විග්‍රහය තුළ එවැනි බෙදීමක් දක්නට නොමැති අතර බෞද්ධ විග්‍රහය තුළ විඥානයේ ස්වරූප දෙකක් පිළිබඳ සාකච්ඡා කෙරේ. ෆ්‍රොයිඩ්ගේ මනස සම්බන්ධ දෙවන විග්‍රහය වන්නේ Id, Ego, Super Ego විග්‍රහය යි. මෙමඟින් ෆ්‍රොයිඩ් මනසට යම් යාන්ත්‍රික භාවයක් ආරෝපණය කර ඇති ආකාරයක් හඳුනා ගත හැක. එනම් සිතේ අපිරිසිදු මනෝභාවයන් Id තුළත්, සදාචාරාත්මක අංශය Super Ego තුළත් පවතින බව සඳහන් කරන ෆ්‍රොයිඩ් මෙම අංශ දෙකේ ගැටුමක් නිර්මාණය වන බවත් ඒ සඳහා මැදිහත් වන තෙවැනි පාර්ශවය වන්නේ Ego බවත් දක්වයි. මෙම විග්‍රහය බෞද්ධ මනෝවිද්‍යාත්මක අර්ථයෙන් ගත් කළ බුදුදහමට අනුව සිත ස්වභාවයෙන්ම පිරිසිදු වූවකි. නමුත් බාහිරින් පැමිණෙන ක්ලේශයන්ගෙන් එය අපිරිසිදු වේ. අපිරිසිදු වූ සිත පුද්ගලයා විසින්ම උට්ඨාන වීර්යයෙන් යුතුව පිරිසුදු කරගත යුතු ය. ඒ සඳහා කුසල් වර්ධනය කළ යුතුය. මෙම අදහස ෆ්‍රොයිඩ්ගේ Ego සංකල්පයට යම් සමානතාවක් දක්වන බව හඳුනා ගත හැක. නමුත් ෆ්‍රොයිඩ්ගේ Id සංකල්පයට අනුව මිනිස් සිත ස්වභාවයෙන් ම අපිරිසිදු ය. බුදුදහම මෙම අදහස ප්‍රතික්ෂේප කරන අතර ෆ්‍රොයිඩ්ගේ දෙවන විග්‍රහය වන Super Ego සංකල්පයට අනුව මනස සංස්කරණය කළ යුතුය යන්න බුදු දහම පිළිගනී. එසේ ම ෆ්‍රොයිඩ් පෙන්වා දෙන Ego සංකල්පයත් බුදුදහම ප්‍රතික්ෂේප නොකරන නමුත් එය ස්තර වශයෙන් පවතින ස්වභාවයක් නොව පුද්ගලයාගේ සමස්ත මානසික ක්‍රියාවලියේ ම තවත් එක් ස්වභාවයක් පමණි.



**ප්‍රමුඛ පද:** මනස, බෞද්ධ මනෝවිද්‍යාව, මනෝවිශ්ලේෂණය



CamScanner